**මාවතගම ප්‍රාදේශීය සභාව - 2021**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මාවතගම ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

    - අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉකුත් වර්ෂවල ගෙවා තිබූ කර්මාන්ත ණයහිමි ශේෂ 9ක වටිනාකම රු.4,457,821 ක් නැවත ගෙවිය යුතු ලෙස සටහන් කර තිබීම හේතුවෙන් එම වටිනාකමෙන් ණයහිමි හා ප්‍රාග්ධන වියදම් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ශේෂ 02 ක වටිනාකම රු.4,526,626 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබූ අතර මාවතගම බස් නැවතුම්පල ඉදිකිරීම 02 අදියර සඳහා ගෙවිය යුතු වටිනාකම රු.11,396,889ක මුදලක් කර්මාන්ත ණයහිමි ලෙස දෙවරක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.<br><br>(ඇ) 2019 වර්ෂයේ ප්‍රතිපාදන මත රු. 1,124,400 ක් වටිනා කර්මාන්ත 05ක් 2021 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණද ක්‍රියාත්මක කරන ලද කර්මාන්තයක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. එම වැරැද්ද 2021 වර්ෂයේදීද නිවැරදි කිරීමට කටයුතු නොකිරීම නිසා කර්මාන්ත ණය හිමියෝ එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද සමුච්චිත අරමුදල් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.<br><br>(ඈ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන වියදම රු.160,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,592,419 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,025,832 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට ඒකක 4,708 න් අයවිය යුතු හිඟ වරිපනම් මුදල රු.1,719,891 කි. | හිඟයෙන් කොටසක් අය කරගෙන ඇත. ඉදිරියේදී මුළු හිඟයම අය කරගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### කාර්යය සාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුද්ගලික සමාගමක් විසින් 2020 ජනවාරි සංවර්ධන බලපත්‍රයක් ලබාගෙන අක්කර 03 රූඩ් 02 පර්චස් 36.55 ක ඉඩමක් සංවර්ධනය කර ඇත. මෙම ඉඩමෙන් පොදු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවට ලබාගත යුතු පර්චස් 60 ක පමණ ඉඩම සභාවට ලබා දී නොතිබුණි. තවද මාර්ග, කාණු, බෝක්කුද විධිමත්ව සකස් කර නොතිබුණි. මෙම වෙන්දේසි ඉඩම වටා ඉදිකර ඇති ආරක්ෂිත බ්ලොක් ගල් තාප්පය ඉවත්කර කොන්ක්‍රීට් තාප්පයක් ඉදිකරන ලෙස දැනුවත් කර ඇතත් මෙම වෙන්දේසිකරු එම උපදෙස් ඉටුකර නොතිබූ බවද නිරීක්ෂණය විය. | ඉඩමට අයත් පොදු කොටස සඳහා අදාළ ඔප්පු ලියාපදිංචිය සඳහා යොමු කර ඇති බව දන්වා සිටිමි. කොන්ක්‍රීට් තාප්පය ඉදි කරන ලෙස අදාළ ආයතනයට දන්වා යවා ඇති අතර, එම කාර්ය නොකරන්නේ නම් එය ආයතනය පිළිබඳ නීත්‍යානුකූලව පියවර ගන්නා බව ලිඛිතව සඳහන් කර ඇත. | පොදු කටයුතු සඳහා ලබාගත යුතු ඉඩම් ලබාගෙන යටිතල පහසුකම් හා සභාව කරන ලද නිර්දේශයන් ක්‍රියාත්මක කළ පසු අනුකූලතා සහතිකය ලබා දී කොටස් කළ ඉඩම් විකිණීමට අනුමැතිය ලබාදිය යුතු වේ. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව සතු පරගහදෙණිය විසිවත්ත ඉඩම අක්කර 04 රූඩ් 03 පර්චස් 32 පමණ වන අතර මෙහි සභාව සතු ගවඝාතක මඩුවක්, ක්‍රීඩා පිටියක්, සායන මධ්‍යස්ථානයක් හා පෙර පාසැලක් ඉදිකර තිබුණි. මෙම ඉඩම ආරක්ෂා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ගවඝාතක මඩුව අසල බාහිර පාර්ශවයක් සභාව සතු ඉඩම අල්ලා වැට ගසා තිබුණි. නුවර- කුරුණෑගල මාර්ගයට ආසන්නයේ සභාව සතු මෙම ඉඩමේ පර්චස් 02ක් පමණ අල්ලාගෙන අනවසර කඩයක් ඉදිකර තිබූ බවද නිරීක්ෂණය විය. | 2022 අප්‍රේල් 05 දිනැතිව ප්‍රාදේශීය ලේකම් වෙත සිහිකැඳවීමක් යොමු කර ඉඩම පවරා දීමේ කටයුතු කඩිනම් කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව කාරුණිකව දන්වමි. | ඉඩමේ අයිතිය තහවුරු කරගෙන ආරක්ෂා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.3 දෘෂ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඩේසිමවුන්ට් ඉඩම් වෙන්දේසිය 1997 වර්ෂයේදී අදියර 08 කින් සිදුකර තිබූ අතර වෙන්දේසි කළ ඉඩම් ප්‍රමාණය අක්කර 29 රූඩ් 15 පර්චස් 882 ක් විය. මෙම ඉඩම් වෙන්දේසියෙන් පර්චස් 546 ක ඉඩම් ප්‍රමාණයක් පොදු කටයුතු සඳහා ලැබී තිබිය යුතු වුවත් 2022 මාර්තු 10 දින සිදුකළ භෞතික විගණන පරීක්ෂාවේදී මෙම ඉඩම් වෙන්දේසියෙන් පොදු ඉඩම් ලබාගෙන නොතිබුණි. ෆිනෑන්ස් ආයතනයට කළ ඉල්ලීමක් මත පර්චස් 20 ක පමණ ඉඩම් කොටසක් ලබාගෙන ප්‍රජා ශාලාවක් හා ක්‍රීඩා පිට්ටනියක් ඉදිකර තිබූ බව නිරීක්ෂණය විය. | පරණ ලිපි ගොනු සොයා බලා අදාළ ආයතන දැනුවත් කර පොදු ඔප්පු සොයා ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බවත් වර්තමානයේ කට්ටි කරන ඉඩම්වලට අදාළ පොදු ඉඩම්වලට ඔප්පු ගෙන්වා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වෙන්දේසි ඉඩම්වලින් ලබාගතයුතු පොදු කොටස් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |